ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2014 ජනවාරි මස 21 වැනි දින |

## ශ්‍රී ලංකාවේ දත්ත සහ සංඛ්‍යාලේඛන

මෑතකදී ශ්‍රී ලංකාවේ දත්ත සහ සංඛ්‍යාලේඛන පිළිබඳ පුවත්පත් වාර්තා වශයෙන් පළවූ, විවිධ පුද්ගලයන් විසින් සිදුකළ යම් ප්‍රකාශනයන් පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව කණගාටුවෙන් යුතුව අවධානය යොමුකර සිටී. මෙම පුවත්පත් වාර්තා මගින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ඇතැම් තෝරාගත් පුද්ගලයන් විසින් සිදුකළ යම් ප්‍රකාශයන් වැරදි සහගත ලෙස පාදක කොටගෙන ජාතික ආදායම් ගිණුම් සහ වෙනත් දර්ශකයන් සම්පාදනය සඳහා භාවිත කරන දත්තයන්හි විශ්වසනීයත්වය පිළිබඳ ප්‍රශ්න කර ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව, මෙම පුවත්පත් වාර්තාවන්හි සඳහන් ප්‍රකාශයන් සහ දෝෂාරෝපණයන් අසත්‍ය සහ පදනම් විරහිත බවත්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි නිර්දේශයන් මෙම ලේඛකයන් විසින් විකෘති කර ඉදිරිපත් කර ඇති බවත්, එහි ප්‍රකාශයන් බොහෝ ලෙස සන්දර්භයෙන් පරිබාහිරව භාවිත කර ඇති බවත් ප්‍රකාශ කර සිටියි. එම සමහර ප්‍රකාශයන්, ශ්‍රී ලංකාව දත්ත සම්පාදනය සහ මුදාහැරීමේ ප්‍රමිතීන් පිළිබඳ අත්පත් කර ගත් දියුණුව නොසලකා හැර ඇති අතර, එබැවින් ශ්‍රී ලංකා මහ බැංකුව මෙම මාතෘකාව සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන්නන්ගේ ප්‍රයෝජනය සඳහා පහත සඳහන් කරුණු ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරයි.

1. ශ්‍රී ලංකාව දැනට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි සාමාන්‍ය දත්ත මුදාහැරීමේ ක්‍රියාපටිපාටිය (GDDS) අනුගමනය කරන අතර, 2000 වර්ෂයේ ජූලි මාසයේ සිට එයට සහභාගී වූ රටක් වේ. මහ බැංකුව සහ ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත, එහි IV වන ප්‍රඥප්තියෙන් දක්වා ඇති අන්දමට දේශීය තොරතුරු/දත්ත සපයයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල නියත වශයෙන්ම මෙම තොරතුරු ඔවුන්ගේ ප්‍රකාශන සහ වාර්තාවලට යොදාගෙන ඇති අතර, එමගින් දත්ත සැකසීම සහ සපයන ලද තොරතුරු පිළිබඳ ඔවුන්ගේ ඇති පැහැදීම සහ විශ්වාසය පිළිබිඹු කෙරේ.

2. සමහර පුවත්පත් ලිපි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ IV වන ප්‍රඥප්තියට අදාළ දූතමණ්ඩල සාකච්ඡා (Article IV Consultation Mission) වලින් අනතුරුව, 2013 වසරේ අප්‍රේල් මස ප්‍රකාශයට පත්කළ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ මාණ්ඩලික වාර්තාව උපුටා දක්වා ඇති බව පෙනේ. මනාව දන්නා පරිදි, IV වන ප්‍රඥප්තියට අදාළ දූතමණ්ඩල සාකච්ඡාවන් මඟින් සාමාන්‍යයෙන් සාමාජික රටවල දත්ත පිළිබඳ සාකච්ඡා කෙරෙන අතර, එවැනි සෑම අවස්ථාවකදීම සෑම සාමාජික රටවල් සඳහා තවදුරටත් තම දත්ත සම්පාදනය දියුණු කිරීමට අදාළ නිර්දේශයන් යෝජනා කෙරෙයි. එබැවින්, ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් යෝජිත නිර්දේශයන් රටෙහි ජාතික ගිණුම් සංඛ්‍යාලේඛන සම්පාදනය තවදුරටත් දියුණු කර ගැනීමට ඉවහල්වන ක්‍රියාමාර්ගයන් වන අතර, එයින් කිසිලෙසකත් පවත්නා ක්‍රමවේදය මත විශ්වාසය තැබිය නොහැකි බවක් නොහැඟවේ. එමෙන්ම, ශ්‍රී ලංකාව ස්වාධීනවම ජාතික ආදායම් සංඛ්‍යාලේඛන සම්පාදනය තවදුරටත් දියුණු කරගැනීම සඳහා පුළුල් පරාසයකින් යුත් ක්‍රියාමාර්ග රැසක් ක්‍රියාවට නංවා ඇත. මෙම පසුබිම තුළ, දත්ත සම්පාදනය පිළිබඳ රට තුළ වර්තමානයේ පවත්නා තත්ත්වය සතුටුදායක නොවන හා ඒ මත විශ්වාසය තැබිය නොහැකි බවට වන සාවද්‍ය නිගමනයන් තහවුරු කිරීම සඳහා සත්‍ය කරුණුවලින් පරිබාහිරව සැකසුණු එම පුවත්පත් ලිපිවල සඳහන් කෙරෙන අදහස් දැක්වීම් පවත්නා දත්තයන් තුළින් තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ආර්ථිකය අත්පත්කරගෙන ඇති ප්‍රගතියට හානිකිරීමට ගත් අනුචිත ප්‍රයත්නයක් බව මහ බැංකුවේ අදහසයි.

3. ශ්‍රී ලංකාව විසින් කරනු ලැබූ ඉල්ලීමකට ප්‍රතිචාර දැක්වීමක් ලෙස 2013 වසරේ සැප්තැම්බර්/ඔක්තෝබර් කාලය තුළ දී දළ දේශීය නිෂ්පාදිත ඇස්තමේන්තු සහ කාර්තුමය ජාතික ආදායම් ගිණුම් ප්‍රතිපදනම්ගත කිරීම සඳහා අවශ්‍ය ශිල්පීය ඥානය සැපයීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ තාක්ෂණ සහාය දූත පිරිසක් ශ්‍රී ලංකාවට පැමිණීම පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව සිය ප්‍රසාදය පළ කරයි. එම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ දූත පිරිස විසින් ශ්‍රී ලංකාව අවම අවශ්‍යතාවයන් බොහොමයක් සපුරාගෙන ඇති බවට හඳුනාගෙන ඇති අතර, ආයතනික අංශයේ ගිණුම් කිහිපයක් සම්බන්ධයෙන් හැරුණුකොට 1993/2008 ජාතික ආදායම් ගිණුම් පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා අදාළ දත්ත කට්ටලයන් නිර්දේශ කරන ලදී. මේ සම්බන්ධයෙන්, 1993/2008 ජාතික ආදායම් ගිණුම් පද්ධතිය ස්ථාපනය කිරීමෙහිලා, ශ්‍රම බලකා සමීක්ෂණ සහ එකතු කළ අගය මත බදු යනාදී දත්තයන් වක්‍ර ක්‍රම මඟින් භාවිතා කරමින් දේශීය ගිණුම් සම්පාදනය කිරීමේ විකල්ප මූලාශ්‍රයන් ලෙස යොදා ගැනෙයි. එවැනි වක්‍ර ක්‍රම මඟින් දත්තවල නිරවද්‍යතාවය තහවුරු කිරීම බොහෝ රටවල් විසින් සිදුකෙරෙන අතර, එය පිළිගත් සම්මතයන් හා අනුගතවී පවතී.

4. මේ අතරතුර, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව 2013 වසරේ දී ආර්ථික සංගණනයක් පවත්වා ඇති අතර, 2014 වසරේ දී පසුවිපරම් ස්ථාපන සමීක්ෂණ පැවැත්වීමට සැලසුම් කර ඇත. මෙම සමීක්ෂණ ද ජාතික ආදායම් දත්ත මූලාශ්‍රයන්හි යම් අඩුපාඩුවක් ඇත්නම්

කෙටි හා මැදිකාලීනව ඒවා මඟහරවා ගැනීමට ඉලක්ක කර ඇත. මීට අමතරව, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මෙම වසරේ දී දළ ජාතික නිෂ්පාදිතය ගණනය කිරීමේ පාදක වර්ෂය 2010 වසර ලෙස සංශෝධනය කිරීමට සැලසුම් කර ඇති අතර, ඒ සඳහා වන වැදගත් පියවරයන් දැනටමත් ක්‍රියාත්මක කර ඇත.

මෙම පසුබිම යටතේ, ඉහත දී සඳහන් කළ ප්‍රවෘත්ති වාර්තා ජාතික ගිණුම් දත්ත සම්පාදනය කිරීමේ ක්‍රමවේදයක් ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකාව තුළ සිදුවෙමින් පවතින සංවර්ධනාත්මක තත්ත්වයක් පිළිබඳ අනවබෝධයෙන් හෝ ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සහ මහ බැංකුවේ ප්‍රතිරූපයට හානිකිරීමේ චේතනාවෙන් ලියැවී ඇති බව ශ්‍රී ලංකා මහ බැංකුව නැවත වරක් ප්‍රකාශ කර සිටී. එබැවින්, මහ බැංකුව සහ ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව දත්තවල විශ්වාසනීයත්වය තහවුරු වන පරිදි දත්ත සම්පාදනය කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ සංකීර්ණ කාර්යය සම්බන්ධයෙන් ප්‍රමුඛතාවය යොමුකරවන ආකාරය සහ එහි සත්‍ය තත්ත්වය පිළිබඳව අවධානයෙන් සිටිය යුතු බවට මහ බැංකුව විසින් මහජනතාවට දැනුම් දෙනු ලැබේ. ඉහළ ගුණාත්මකභාවයකින් යුත් දත්ත බෙදාහැරීම සඳහා අවශ්‍ය සියලු උත්සාහයන් ගෙන ඇති බවට මහ බැංකුව සියලු පාර්ශ්වයන්ට සහතික වන අතර, ඒ අනුව දේශපාලනික න්‍යායන් ඉටු කර ගැනීමේ අරමුණින් ඉදිරිපත් කර ඇතැයි සැලකිය හැකි වාර්තා සහ ප්‍රකාශ තුළින් නොමග නොයන ලෙස මහජනතාවට දන්වා සිටියි.